ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
චක්‍රලේඛ අංක - NGJA/ EXP 2/2022
2022.05.18

# සියළුම මැණික් හා ස්වර්ණාභරණ අපනයන කරුවන්ගේ දැන ගැනීම සඳහා,

**නිවැරදි තොරතුරු ඉදිරිපත් කරමින් මැණික් සහ ස්වර්ණාභරණ අපනයනයන් සිදු කිරීම.**

පවත්නා වෙළඳපල වටිනාකමට අනුකූල වන පරිදි සත්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් මැණික් සහ ස්වර්ණාභරණ අපනයනය කිරීම සඳහා අපනයනකරුවන් උනන්දු කරවීම අරමුණු කරගනිමින් මෙම ක්‍රමවේදය හඳුන්වා දෙනු ලැබේ.

ඒ අනුව මින්මතු 2022/05/23 දින සිට මෙම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව මැණික් හා ස්වර්ණාභරණ අපනයන කටයුතු සිදු කරන ලෙස සියලුම මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන් වෙත මෙයින් දන්වනු ලැබේ.

1. මෙම ක්‍රමවේදය යටතේ සෑම මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවෙකු විසින්ම අධිකාරිය විසින් අංක **NGJA 8.3/ Dec.1** යටතේ හඳුන්වා දෙනු ලබන නව **ඉන්වොයිස් පත්‍ර ප්‍රකාශය** නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කල යුතු අතර අපනයනය කරනු ලබන මැණික් ගල් සම්බන්ධයෙන් වන සම්පූර්ණ විස්තරයක් මේ සමඟ "ඇමුණුම 1" වශයෙන් ඉදිරිපත් කරනු ලබන ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශයේ දක්වා ඇති ආකාරයට පැහැදිලිව ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

2. එනම්, එහිදී විශේෂයෙන් ඒ ඒ මැණික් වර්ග වෙන් වෙන්ව ඒවායේ අපේක්ෂිත වෙළඳ පොළ වටිනාකම සමග ඒ ඒ මැණික් ගලට අදාල බර සහ ප්‍රමාණය වෙන්වෙන් වශයෙන් පැහැදිලිව සටහන් කර තිබීම අනිවාර්ය වේ.

3. මෙහිදී ප්‍රථමයෙන්ම ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශය නිවැරදිව යොමුකරන ආකාරය පිළිබඳව මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන් හා වාප්පු ලිපිකරුවන් දැනුවත් කිරීම අධිකාරිය විසින් සිදු කරන අතර කැරට් 10 ට වැඩි හෝ/සහ මැණික් ගල්, අපනයන කරන අවස්ථාවක රාජකාරි දින වල සවස 2.30 ට පෙර ඉදිරිපත් කළ යුතුවේ.

4. අධිකාරිය විසින් අංක **NGJA 8.3/ Dec.2** යටතේ පවත්නා මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳපොල වටිනාකම දැක්වෙන ලේඛනයක් මින් පසු හඳුන්වා දෙනු ලබන අදාල ලේඛනය සෑම මාස 03 කට වරක්, වැඩකරන පළමු දින යාවත්කාලින කරමින් අධිකාරියේ වෙබ් අඩවියේ පල කරනු ලැබේ.

5. ඒ අනුව සෑම අපනයනකරුවෙකු විසින්ම අපනයනයක් සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම මැණික් සහ ස්වර්ණාභරණ තොගයක් / පාර්සලයක් සමඟ ම ඉහත කී ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු අතර එකී මැණික් සහ ස්වර්ණාභරණ තොගය / පාර්සලය අධිකාරිය විසින් භෞතිකව පරීක්ෂා කොට එක් එක් අයිතමයන්ගේ වෙළඳපල වටිනාකම **NGJA 8.3/ Dec.2** සමඟ සසඳා බලනු ලැබේ.

6. එහිදී අපනයනකරුවෙකු සිය අපනයන පාර්සලයේ විස්තර දක්වමින් ඉදිරිපත් කරනු ලබන NGJA 8.3/ Dec.1හි සඳහන් තොරතුරු NGJA 8.3/ Dec.2 සහ අධිකාරියේ නිරීක්ෂණ සමඟ නොගැලපෙන්නේ නම්, අධිකාරිය විසින් පහත පරිදි මින් මතු කටයුතු කරනු ලැබේ.

7. **30% ක් දක්වා වූ වෙනසක් පවතින අවස්ථා**

   (i) අංක NGJA 8.3/ Dec.2 යටතේ අධිකාරිය විසින් සකස් කරන ලද ලේඛනයේ සඳහන් වන අගයන් හා අපනයනකරු ඉදිරිපත් කරනු ලබන ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශයේ අගයන් සසඳා බැලීමේදී එම අගයන් අතර 30% ක් දක්වා වූ වෙනසක් පවතින අවස්ථාවකදී ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශයේ සඳහන් කර ඇති අගය වෙනස් නොකර අපනයනය කිරීමට අපනයනකරුට අධිකාරියේ අනුමැතිය හිමි වේ.

(ii) එහෙත් එවැනි අවස්ථාවකදී අධිකාරිය විසින් යෝජනා කරනු ලබන වෙළඳපල වටිනාකම සම්බන්ධයෙන් අපනයනකරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලබන අතර අධිකාරිය යෝජනා කරනු ලබන වටිනාකමට අපනයනකරු එකග වන්නේ නම් නව ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට ද අමතර දඩමුදලකින් තොරව නියමිත මිලට ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශය සකස් කර අපනයනය සිදු කිරීමට ද අපනයනකරුට අවස්ථාව හිමි වේ. එම අපනයනය සඳහා සාමාන්‍ය පරිදි 0.25% සේවා ගාස්තුව අය කරනු ලැබේ.

8. 31% සිට 50% ක් දක්වා වූ වෙනසක් පවතින අවස්ථා

(i) අංක NGJA 8.3/ Dec.2 යටතේ අධිකාරිය විසින් සකස් කරන ලද ලේඛනයේ සඳහන් වන අගයන් හා අපනයනකරු ඉදිරිපත් කරනු ලබන ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශයේ අගයන් සසඳා බැලීමේදී එම අගයන් අතර 31% සිට 50% ක් දක්වා වූ වෙනසක් පවතින අවස්ථාවකදී අධිකාරිය විසින් යෝජනා කරනු ලබන වෙලඳපල වටිනාකමට අපනයනකරු එකඟ වන්නේ නම් එවිට එම අපනයනය සඳහා අධිකාරිය යෝජනා කරනු ලබන සම්පූර්ණ වටිනාකමට සාමාන්‍ය පරිදි 0.25% සේවා ගාස්තුවක් අය කරනු ලැබේ.

(ii) අධිකාරිය විසින් යෝජනා කරනු ලබන වෙලඳපල වටිනාකමට අපනයනකරු එකඟ නොවන්නේ නම් එවිට අදාල අපනයන පාර්සලය ඉවත්කර ගැනීමට අපනයකරුට අවසරය හිමි වේ.

(iii) එහෙත් එහිදී අධිකාරිය විසින් දඩුවම් පත්‍රිකාවක් (Red Card) අපනයනකරු වෙත නිකුත් කරනු ලැබේ. එක් වර්ෂයක් ඇතුළත යම් අපනයනකරුවෙකු වෙත එවැනි දඩුවම් පත්‍රිකා 3 ක් අධිකාරිය විසින් නිකුත් කර ඇත්නම් එම වර්ෂය තුළ නැවත කිසිදු අවස්ථාවක එලෙස අධිකාරිය වෙත ඉදිරිපත් කළ අපනයන පාර්සලයක් ඉවත්කර ගැනීමට එම අපනයනකරුට අවස්ථාවක් හිමි නොවන අතර එලෙස ඉවත් කර ගැනීමට උත්සහ ගන්නා සෑම පාර්සලයක්ම අධිකාරිය විසින් අනිවාර්යෙන් ම රාජසන්තක කරනු ලැබේ.

9. 51% -100% ක් දක්වා වූ වෙනසක් පවතින අවස්ථා

(i) අංක NGJA 8.3/ Dec.2 යටතේ අධිකාරිය විසින් සකස් කරන ලද ලේඛනයේ සඳහන් වන අගයන් හා අපනයනකරු ඉදිරිපත් කරනු ලබන ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශයේ අගයන් සසඳා බැලීමේදී එම අගයන් අතර 51% -100% ක් දක්වා වූ වෙනසක් පවතින අවස්ථාවකදී අධිකාරිය විසින් යෝජනා කරනු ලබන වෙලඳපල වටිනාකමට අපනයනකරු එකඟ වන්නේ නම් එවිට එම අපනයනය සඳහා අධිකාරිය යෝජනා කරනු ලබන සම්පූර්ණ වටිනාකමට සාමාන්‍ය පරිදි 0.25% සේවා ගාස්තුව අය කරනු ලබන අතර අධිකාරිය යෝජනා කරනු ලබන වෙලඳපල වටිනාකමෙහි වෙනසට පමණක් 0.5% ක දඩමුදලක් අය කරනු ලැබේ.

(ii) අධිකාරිය විසින් යෝජනා කරනු ලබන වෙළඳපල වටිනාකමට අපනයනකරු එකඟ නොවන්නේ නම් අදාල අපනයන පාර්සලය ඉවත්කර ගැනීමට අපනයකරුට අවසරය හිමි නොවන අතර අදාළ පාර්සලය අනිවාර්යයෙන් රාජසන්තක කරනු ලැබේ.

10. අදාළ වෙනස 101% වඩා වැඩිවන අවස්ථා

(I) අංක NGJA 8.3/ Dec.2 යටතේ අධිකාරිය විසින් සකස් කරන ලද ලේඛනයේ සඳහන් වන අගයන් හා අපනයනකරු ඉදිරිපත් කරනු ලබන ඉන්වොයිස්පත්‍ර ප්‍රකාශයේ අගයන් සසඳා බැලීමේදී එම අගයන් අතර 101% ට වඩා වැඩි වෙනසක් පවතින අවස්ථාවකදී අධිකාරිය විසින් යෝජනා කරනු ලබන වෙලඳපල වටිනාකමට අපනයනකරු එකඟ වන්නේ නම් එවිට එම

අපනයනය සඳහා අධිකාරිය යෝජනා කරනු ලබන සම්පූර්ණ වටිනාකමටම 0.5% ක දඩ මුදලක් ද අය කරනු ලැබේ.

(II) අධිකාරිය විසින් යෝජනා කරනු ලබන වෙළඳපල වටිනාකමට අපනයනකරු එකඟ නොවන්නේ නම් අදාල අපනයන පාර්සලය ඉවත්කර ගැනීමට අපනයකරුට අවසරය හිමි නොවන අතර අදාළ පාර්සලය අනිවාර්යයෙන් රාජසන්තක කරනු ලැබේ.

**11. අපනයනයට අදාළ මැණික් සහ ස්වර්ණාභරණ වල වර්ගය, ගුණාත්මකභාවය, ප්‍රමාණය, විශාලත්ව සහ බර සම්බන්ධයෙන් වන තොරතුරු අසත්‍ය වන අවස්ථා**

(i) - මෙවැනි අවස්ථාවකදී අදාළ මැණික් සහ ස්වර්ණාභරණ තොගය/ පාර්සලය කුමන වටිනාකමකින් යුක්ත වුවද, එකී තොගයේ / පාර්සලයේ ඇති මැණික් සහ ස්වර්ණාභරණ වල වර්ගය, ගුණාත්මකභාවය, ප්‍රමාණය, විශාලත්ව සහ බර සම්බන්ධයෙන් වන තොරතුරු අපනයනකරු විසින් අසත්‍ය ලෙස NGJA 8.3/ Dec.1හි සඳහන් සටහන් කර ඇති බවට අධිකාරියට නිරීක්ෂණය වන්නේ නම්, එම හේතුන් මත අපනයන තක්සේරු වටිනාකම 100% ක ප්‍රමාණයකින් වැඩිවන්නේ නම් එවැනි අවස්ථාවල අදාල පාර්සලය අනිවාර්යෙන්ම රාජසන්තක කෙරේ. එසේ වැඩිවන අපනයන තක්සේරු වටිනාකම 100% කට වඩා අඩුවන අවස්ථාවකදී ඉහත කරුණු අංක 07, 08 හා 09 ට අනුව කටයුතු කරනු ලැබේ.

- අදාළ පාර්සල් රාජසන්තක කෙරෙන එක් වර්ෂයක් තුළ එලෙස රාජසන්තක වන අවස්ථා තුනකින් පසු එම අපනයනකරුගේ නමට ලිත් වර්ෂ 05 ක් යනතුරු නැවත මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳ බලපත්‍රයක් අධිකාරිය විසින් නිකුත් කරනු නොලැබේ.

12. අධිකාරිය විසින් මුද්‍රා තබනු ලබන පාර්සලයක්/පාර්සල් කිසිදු පෙර දැනුම් දීමකින් තොරව ශ්‍රී ලංකා රේගුව සහ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් කටුනායක ගුවන් තොටුපලේ දී නැවත පරික්ෂාවට ලක්කල හැකි අතර එහිදී ඉන්වොයිස් පත්‍රයේ දැක්වෙන අයිතමයට අමතරව වෙනත් අයිතම් ඇතුළත්ව තිබිම හෝ වටිනාකම්හි වෙනසක් සිදුව තිබීම නිරීක්ෂණය වුවහොත් එම පාර්සලය/පාර්සල් අනිවාර්යෙන්ම රාජසන්තක කිරිමට කටයුතු කරනු ලැබේ.

අධිකාරියේ අනුමැතිය යටතේ සිදු කෙරෙන සෑම මැණික් සහ ස්වර්ණාභරණ අපනයනයකදී ම එකී අපනයනයට අදාළ මැණික් සහ ස්වර්ණාභරණ වල වර්ගය, ගුණාත්මකභාවය, ප්‍රමාණය, විශාලත්වය බර හෝ වටිනාකම සම්බන්ධයෙන් මිලදී ගන්නෙකුට වැරදි හැඟීමක් ඇති කිරීමේ හැකියාවක් ඇති වන පරිදි වැරදි සහ අසත්‍ය ලෙස තොරතුරු ඇතුළත් කරමින් ඉන්වොයිස්පත් ඉදිරිපත් කරනු ලබන්නේ යම් අපනයනකරුවෙකු විසින් ද එකී සෑම අපනයනකරුටම එරෙහිව 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ නෛතික බලය අධිකාරිය සතු වේ.

තිලක් වීරසිංහ
**සභාපති ප්‍රධාන විධායක නිලධාරි**
**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**

# SELF DECLARATION FORM FOR INVOICE NO ……………………………………

TO : NATIONAL GEM & JEWELLERY AUTHORITY

Declarant : ………………………………………………………………………………………
(Company with BRC no / Exporter with NIC no.)

Foreign currency A/C No ……………………………………………………………

Bank Name ……………………………………………………………

Date of Export ……………………………………………………………

Country of Export ……………………………………………………………

Consignee Name & Address ……………………………………………………………

……………………………………………………………

……………………………………………………………

CT No ……………………………………………………………

FOB Value ……………………………………………………………

CIF Value ……………………………………………………………

The information I have given is true, correct and complete. I understand that a false or misleading declaration or statement made on this form to a National Gem & jewellery Authority is an offence under the National Gem & jewellery Authority Act No 50 of 1993 and may result in a heavy penalty and/or forfeiture of any amount properly declared.

I hereby agree to declare remitting of foreign currency related to this export or details of consignment return within 180 days from the date of export.

………………………………

Signature
Name of the company/ person

Designation:

Date:

# GEM INVOICE FORMAT

COMPANY NAME

COMPANY ADDRESS

NGJA FILE NO. :

CONSIGNEE :

INVOICE NO. :

DATE :

TERMS :

MODE OF EXPORT :

EXCHANGE RATE :

| ITEM NO. | DESCRIPTION | QTY ( PCS / LOT ) | WEIGHT ( CTS ) | RATE PER ( CTS ) | VALUE ( CURRENCY ) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | TOTAL | | | | |

| | | |
|---|---|---|
| FOB | USD | LKR |
| INSUARANCE | USD | LKR |
| POSTAL / FREIGHT | USD | LKR |
| CIF | USD | LKR |

COMPANY CHOP / SIGNATURE

# JEWELLERY INVOICE FORMAT

COMPANY NAME

COMPANY ADDRESS

NGJA FILE NO. :

CONSIGNEE :

INVOICE NO. :

DATE :

TERMS :

MODE OF EXPORT :

EXCHANGE RATE :

| ITEM NO. | DESCRIPTION | QTY ( PCS ) | WEIGHT ( GRAM ) | RATE PER ( PCS ) | VALUE ( CURRENCY ) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | TOTAL | | | | |

FOB USD LKR

INSUARANCE USD LKR

POSTAL / FREIGHT USD LKR

CIF USD LKR

COMPANY CHOP / SIGNATURE